# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 18 දරන
# දීඝවාපි ප්‍රතිසංස්කරණ සභාව
# (සංස්ථාගත කිරීමේ) පනත

**[සහතිකය සටහන් කළේ 1980 අප්‍රේල් මස 17 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 අප්‍රේල් මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 45 යි

තැපැල් ගාස්තුව : ශත 35 යි

# 1980 අංක 18 දරන දීඝවාපි ප්‍රතිසංස්කරණ සභාව (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1980 අප්‍රේල් මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 90/79.

## දීඝවාපි ප්‍රතිසංස්කරණ සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේ බුද්ධත්වයට පැමිණ වදාළ අට වසක් පිරීමෙන් ඉක්බිති මණිඅක්ඛික නා රජුගේ ආරාධනාවෙන් වෙසක් පුන් පොහෝ දින පන්සියයක් භික්ෂූන් පිරිවරා ශ්‍රී ලංකාද්වීපයේ කල්‍යාණී පුරයට වැඩ වදාළ හෙයින් ද:

එසේ වැඩ වදාළ අවස්ථාවේ දී, පසුව දීඝවාපි චෛත්‍යය ගොඩ නංවන ලද ස්ථානයට තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේ එකී පන්සියයක් භික්ෂූන් ද සමග වැඩ වදාරා එහි භාවනානුයෝගීව වැඩ සිටි හෙයින් ද:

තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේ පන්සියයක් භික්ෂු පර්ෂද් සමග එසේ භාවනානුයෝගීව වැඩ සිටීමෙන් පාරිශුද්ධත්වයට පත් ඒ භූමිභාගයේ දීඝවාපි නමින් චෛත්‍යයක් ක්‍රිස්තු පූර්ව 77 සිට ක්‍රිස්තු පූර්ව 59 දක්වා ශ්‍රී ලංකාද්වීපයේ රාජ්‍ය කළ සද්ධාතිස්ස මහරජු විසින් ඉදිකරවන ලද හෙයින් ද:

ඉන්පසු එකී දීඝවාපි චෛත්‍යය විශිෂ්ට පූජනීය ස්ථානයක් බවට පත් වී, අනුරාධපුර, පොළොන්නරුව සහ වෙනත් නගර රාජධානි කොටගෙන ශ්‍රී ලංකාවේ රාජ්‍ය විචාරූ සියලු රජදරුවන්ගේ පුදසත්කාරයට පාත්‍රව දීඝවාපි චෛත්‍යය සහ තදානුබද්ධ විහාරාරාම එකී රජදරුවන් විසින් ප්‍රතිසංස්කරණය කරවමින් පවත්වා ගෙන යනු ලැබූ හෙයින් ද:

විදේශීය ආක්‍රමණවලින් පසු වාරිමාර්ග පද්ධති විනාශ මුඛයට ගොස් වියළි කලාපයේ සිංහල කෘෂිකාර්මික ශිෂ්ඨාචාරය පරිහානියට පත්වී යාමෙන් ඉක්බිති දීඝවාපි චෛත්‍යය සහ තදනුබද්ධ විහාරාරාම ජරාවාසයට පත් වූ හෙයින් ද:

විසිවන ශත වර්ෂයේ දී ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසු මාර්ග ඉදිකොට වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ හේතුවෙන් දීඝවාපිය අවට පිහිටි දිස්ත්‍රික්ක ශ්‍රී ලංකාවේ සමෘද්ධිමත් කෘෂිකාර්මික ප්‍රදේශයක් බවට යළි පරිවර්තනය වීමත් සමගම දීඝවාපි චෛත්‍යය නැවතත් ශ්‍රී ලංකාවාසී බෞද්ධ ශ්‍රද්ධාවන්තයන්ගේ වැදගත් පූජනීය ස්ථානයක් බවට පත් වී ඇති හෙයින් ද:

දීඝවාපි චෛත්‍යය සහ තදානුබද්ධ විහාරාරාම ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාව අවබෝධ කොට ගත් බෞද්ධ ප්‍රභූන් පිරිසක් ශ්‍රී ලංකාද්වීපයේ ජනාධිපති ගරු ජේ. ආර්. ජයවර්ධන උතුමාණන්ගේ ආණ්ඩුවේ කෘෂිකාර්මික සංවර්ධනය සහ පර්යේෂණ කටයුතු පිළිබඳ අමාත්‍යවර ගරු ඊ. එල්. සේනානායක මැතිතුමාගේ

ප්‍රධානත්වයෙන් සහ මාර්ගෝපදේශකත්වය යටතේ 1978 දෙසැම්බර් මස 30 වැනි දින අම්පාර දිසාපති කාර්යාලයට රැස් වී සිංහල රජදරුවන් කල පැවතියාක් මෙන් දීඝවාපි චෛත්‍යය හා තදානුබද්ධ විහාරාරාම ගොඩනැගිලි පූජනීය ස්ථානයකට උචිත ලෙස ප්‍රතිසංස්කරණය කිරීමේ අධ්‍යාශයෙන් දීඝවාපි ප්‍රතිසංස්කරණ සභාව නමින් සංගමයක් පිහිටුවා ගන්නට යෙදුණු හෙයින් ද :

එකී දීඝවාපි ප්‍රතිසංස්කරණ සභාව සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 1980 අංක 18 දරන දීඝවාපි ප්‍රතිසංස්කරණ සභාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

දීඝවාපි ප්‍රතිසංස්කරණ සභාව සංස්ථාගත කිරීම.

2. මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන් පසුව, (මෙහි මින් මතු "සභාව" යනුවෙන් හඳුන්වනු ලබන) දීඝවාපි ප්‍රතිසංස්කරණ සභාවේ තත්කාලයේ සාමාජිකයන් වන්නා වූ හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ සාමාජිකයන් ලෙස මින් මතු ඇතුළත් කර ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් හඳුන්වනු ලබන) "දීඝවාපි ප්‍රතිසංස්කරණ සභාව" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එය විසින් පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ පාවිච්චි කිරීමේ ද එය තම කැමැත්ත පරිදි වෙනස් කිරීමේ ද සම්පූර්ණ බලය සහ අධිකාරය ඇතිව එකී නාමයෙන් සියලු අධිකරණයන්හි නඩු පැවරීම සහ නඩු පවරනු ලැබීම කළ හැකි වන්නේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ඓතිහාසික දීඝවාපි චෛත්‍යය පිහිටි ප්‍රදේශය පූජා භූමියක් ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය සියලු පියවර ගැනීම ;

(ආ) දීඝවාපි චෛත්‍ය රාජයාණන් වහන්සේ ප්‍රතිසංස්කරණය කරවා කොත් පැළඳවීම හා දීඝවාපි විහාරස්ථානය අංග සම්පූර්ණ බෞද්ධ පූජනීය ස්ථානයක් බවට පත් කිරීමට අවශ්‍ය සියලු ගොඩනැගිලි ඉදිකරවීම හා ඒවා මැනවින් නඩත්තු කරගෙන යාම ;

(ඇ) දීඝවාපි චෛත්‍ය රාජයාණන් හාත්පස ප්‍රදේශවල ඇති සියලු පුරාවිද්‍යාත්මක නෂ්ටාවශේෂ හා පුරාවස්තු සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම ;

(ඈ) දීඝවාපි ප්‍රදේශය අංග සම්පූර්ණ ශුද්ධ නගරයක් බවට පත් කිරීමට අවශ්‍ය සියලු පියවර ගැනීම ;

(ඉ) ශ්‍රී ලංකාවේ බෞද්ධයින්ගේ ප්‍රශ්න විසඳා ගැනීමෙහි ලා සහයෝගය දීමේ දී අවශ්‍ය සියලු පියවර ගැනීම ;

(ඊ) ඉහත සඳහන් පරමාර්ථ ඉටුකර ගැනීමෙහි ලා ආනුෂංගික වූ හා අවශ්‍ය සියලු පියවර ගැනීම.

4. (1) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වූ හෝ උපස්ථම්භක වන්නා වූ සහ ආනුෂංගික වන්නා වූ සියලුම දේවල් කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය. සංස්ථාවේ බලතල සහ කර්තව්‍ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පවරන ලද බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, සංස්ථාවට පහත දැක්වෙන බලතල සහ කර්තව්‍ය ඇත්තේ ය :—

(අ) ආණ්ඩුවෙන් හෝ පෞද්ගලික සංවිධානවලින් හෝ ශ්‍රී ලංකාවෙන් පිටස්තර ප්‍රභවයන්ගෙන් මුදලින් හෝ අන්‍යාකාරයකින් තෑගි, ප්‍රදානයන්, පරිත්‍යාගයන්, ආධාර සහ සම්මාදම් භාර ගැනීම හෝ එකතු කිරීම ;

(ආ) සංස්ථාවේ යහපත සඳහා හෝ එහි පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා, මිල දී ගැනීමකින්, හුවමාරු කිරීමකින්, තෑගිදීමෙන්, උරුම කිරීමෙන් හෝ ඊක්ථවරනය කිරීමෙන් හෝ වෙන යම් ආකාරයකින්, යම් වර්ගයක හෝ කවර හෝ ස්වභාවයක චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීම සහ දැරීම සහ යම් ප්‍රකාශිත භාරයකට යටත්ව හෝ අන්‍යාකාරයකින් හෝ එම දේපළ අවිච්ඡින්න ලෙස හෝ අඩු කාලසීමාවක් සඳහා හෝ දැරීම සහ භුක්ති විඳීම ;

(ඇ) බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වැසීම සහ ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම ;

(ඈ) සංස්ථාවට අයිති හෝ සංස්ථාව විසින් දරනු ලබන යම් චංචල හෝ නිශ්චල දේපළක්, එම දේපළ සම්බන්ධ යම් භාරයකට යටත්ව, විකිණීම, බදුදීම, උකස් කිරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ඉ) සංස්ථාව වෙත පවරන ලද හෝ සංස්ථාවට අයිති මුදල් ප්‍රමාණවත් සුරැකුම්වල ආයෝජනය කිරීම හෝ සංස්ථාවේ කාර්ය සඳහා යෝග්‍ය හෝ අවශ්‍ය ඉඩම්, ගොඩනැගිලි බඩු, චංචල දේපළ හෝ වෙනත් දේපළ මිල දී ගැනීම සඳහා හෝ අත්කර ගැනීම සඳහා ආයෝජනය කිරීම ;

(ඊ) සංස්ථාවට අයිති හෝ සංස්ථාව විසින් දරනු ලබන යම් ඉඩමක යම් ගොඩනැගිල්ලක් හෝ නිර්මාණයක් ඉදි කිරීම හෝ ඉදි කරනු ලැබීමට සැලැස්වීම ;

(උ) පුරා විද්‍යාත්මක සහ සංස්කෘතික වැදගත්කමක් ඇති ස්ථානයක් වශයෙන් සහ බෞද්ධ ආගමික පූජනීය ස්ථානයක් වශයෙන් දීඝවාපි ශුද්ධ භූමිය වර්ධනය කිරීම, ආරක්ෂා කිරීම සහ පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වන ආයෝජන කිරීම හෝ පියවර ගැනීම ;

(ඌ) සංස්ථාවේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන්, සේවකයන් සහ අනුයෝජිතයන් සේවයෙහි නියුක්ත කිරීම ; සහ

(එ) සංස්ථාවේ රීතිවලට යටත්ව සංස්ථාවේ අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා යම් උකස්, බැඳුම්කර හෝ බැඳීම් ඇති කිරීමට, ක්‍රියාවේ යෙදවීමට, ප්‍රදානය කිරීමට හෝ නිකුත් කිරීමට යම් ගිවිසුමකට එළඹීම.

කළමනාකාර කමිටුව.

5. (1) සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන නිලධරයන්ගෙන් සහ වෙනත් තැනැත්තන් සංඛ්‍යාවකගෙන් සමන්විත වන කළමනාකාර කමිටුවක් මගින් සංස්ථාවේ කටයුතු සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව පරිපාලනය කළ යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකාර කමිටුව මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ දී ධුර දරන සභාවේ කළමනාකාර කමිටුවේ සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාව විසින් කලින් කල, තත් කාර්යය සඳහා විශේෂයෙන් කැඳවනු ලබන රැස්වීමක දී සහ බහුතර ඡන්දයෙන්, සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා රීති සාදනු ලැබිය හැකි ය. විශේෂයෙන් සහ ඉහත කී බලයේ ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත දැක්වෙන සියලුම කරුණු සඳහා හෝ ඉන් යම් කරුණක් සඳහා හෝ විධිවිධාන එම රීති මගින් සලස්වනු ලැබිය හැකි ය:—

(අ) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස්වීම සහ ඔවුන් නෙරපීම සහ සාමාජිකයන්ගේ අයිතිවාසිකම්;

(ආ) කළමනාකාර කමිටුව සංස්ථාපනය කෙරෙන නිලධරයන් හා වෙනත් තැනැත්තන් තෝරා පත් කර ගැනීම හා කළමනාකාර කමිටුවේ නිල කාලය;

(ඇ) සංස්ථාවේ හා කළමනාකාර කමිටුවේ රැස්වීම් කැඳවීමේ දී අනුගමනය කළ යුතු සහ එම රැස්වීම්වල කටයුතු ක්‍රියාත්මක කිරීමෙහි ලා අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය;

(ඈ) සංස්ථාවේ නිලධරයන්, ඔවුන් තෝරා පත් කර ගැනීම හෝ පත් කිරීම හා ඔවුන්ගේ පැවැත්ම හා කාර්ය;

(ඉ) සංස්ථාවේ අනුයෝජිතයන් හා සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ පැවැත්ම, කාර්ය හා විනයානුකූල පාලනය;

(ඊ) සංස්ථාවේ අරමුදල් එකතු කිරීම හා වියදම් කිරීම, බැංකු ගිණුම් පවත්වාගෙන යාම හා ක්‍රියාත්මක කිරීම; සහ

(උ) සංස්ථාවේ ගිණුම් විගණනය කිරීම.

(2) මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ දී බලපවත්නා සභාවේ රීති මේ වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා කිසිම රීතියක් හෝ මින් මතු සම්මත කරනු ලබන කිසිම රීතියක් වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම උදෙසා යථා පරිදි කැඳවනු ලැබූ සංස්ථාවේ විශේෂ සභා රැස්වීමකට සහභාගි වී ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයෙන් හැර, කරනු නොලැබිය යුතු ය.

7. සභාපතිවරයා, සභාපතිවරයා නොපැමිණි විට උප සභාපතිවර යකු සහ සම ලේකම්වරයකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඔවුන් දෙදෙනා විසින් එකී සාධන පත්‍ර යෙහි තම නම් අත්සන් කළ යුතු අතර එම අත්සන් කිරීම සාක්ෂි කරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය. මුද්‍රාව සම ලේකම්වරයන්ගේ භාරයෙහි තිබිය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

8. සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා සංස්ථාවේ කිසිම සාමාජිකයකු කිසිම සම්මාදමක් කිරීමට යටත් නොවිය යුතු ය. සාමාජිකයන්ගේ බැඳීම සීමා කිරීම.

9. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හෝ ඔවුන් මඟින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය. ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත නම් වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ පනත් නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ